(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 54.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2010 නොවැම්බර් මස 29 වැනි සඳුදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0376/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආනයනික භාණ්ඩ වන කිරි පිටි, ගෑස්, සීනි, පරිප්පු, ළූණු, අර්තාපල්, සහල්, ටින් මාළු සහ ඛනිජ තෙල් මත පැනවෙන තීරු බදු සහ අනෙකුත් සියලු ආකාරයේ බදු ප්‍රමාණ කොපමණද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ ඉහත සඳහන් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රමාණයන් කොපමණද;

(iii) පසුගිය වර්ෂ 5 තුළ බදු පැනවීමෙන් උපයාගත් ආදායම කොපමණද;

(iv) එකී භාණ්ඩ අතරින් දේශීය වශයෙන් නිෂ්පාදනය කෙරෙන යම් භාණ්ඩ වේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල නිෂ්පාදන ප්‍රමාණයන් වාර්ෂික පදනමින් කොපමණද;

(v) පසුගිය වර්ෂ 5 තුළ එම භාණ්ඩවල වාර්ෂික පරිභෝජනය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0506/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006, 2007, 2008, සහ 2009 යන වර්ෂයන්හිදී හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ රජය විසින් ඉදිකළ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිවාස ඉදිකිරීම වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

(iii) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0619/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) දික්වැල්ල ප්‍රාදේශීය සභාව, එම බල ප්‍රදේශයට අයත් බතීගම ගම මැද ආදාහනාගාරයක් ඉදි කිරීමට කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉදි කිරීම නවතා වෙනත් ජන ශූන්‍ය ස්ථානයක එය ඉදි කරන ලෙස පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව මෙයට පෙර දැනුම් දීමක් කර තිබේද;

(ii) එසේ නම්, එම දැනුම්දීම් අනුව අදාළ ප්‍රාදේශීය සභා සභාපතිවරයා කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, මෙම උත්තරීතර සභාවේ තීරණවලට එරෙහිව යමින් ප්‍රාදේශීය සභා සභාපතිවරයා විසින් මෙම ගරු සභාව හෑල්ලුවට ලක් කරමින් තම අභිමතය මත කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඊට අදාළව ඔහුට එරෙහිව ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද;

(v) එම ඉදිකිරීම ඉවත් කිරීමට කටයුතු කරන්නේද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0624/'10

4.

ගරු ආර්. යෝගරාජන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ 12, හුසේනියා මාවත, අංක 45 හි පිහිටි හමීඩ් අල් හුසේනියා විද්‍යාලයෙහි බරපතළ ගුරු හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල සඳහා අනුමත වී ඇති එක් එක් විෂය සඳහා වූ සිංහල සහ දෙමළ මාධ්‍ය ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(iii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් පවතින ගුරු හිඟය කොපමණද;

(iv) ඉහත සඳහන් ගුරු හිඟයට පිළියම් යෙදීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රාජකීය, ආනන්ද සහ නාලන්ද විද්‍යාලවල ගුරු අතිරික්තයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත (ඇ) කොටසෙහි සඳහන් පාසල්වල සිටින අතිරික්ත ගුරුවරු සංඛ්‍යාව එක් එක් මාධ්‍ය අනුව සහ එක් එක් විෂය අනුව කොපමණද;

(ii) පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම අතිරික්ත ගුරුවරු හමීඩ් අල් හුසේනියා විද්‍යාලයට මාරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0680/'10

5.

ගරු ඒ. විනායගමූර්ති මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මයිලිඩ්ඩි ප්‍රදේශයේ පදිංචිව සිටි ධීවර පවුල් 450කට ආසන්න සංඛ්‍යාවක් 1990 වසරේ සිට වාල්වහම් මරුතනාමඩම් හි තාවකාලික නිවාසවල පදිංචිකර ඇති බව එතුමා දන්නෙහිද;

(ආ) මයිලිඩ්ඩි ප්‍රදේශයට ගොස් පදිංචිවීමට එම ධීවරයින්ට අවසර ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0708/'10

6.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 අගෝස්තු දක්වා කාල සීමාවේදී කොරියානු රජය මගින් ශ්‍රී ලංකාවට ලබා දුන් විදේශ රැකියා සංඛ්‍යාව එක් එක් වර්ෂය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා අවස්ථාවක් ලබා ගැනීමට පුද්ගලයකු විසින් අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එම රැකියා සඳහා පිටත්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොරියානු රැකියාවක් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියා පදිංචි වී සිටින සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වූ කොරියානු රැකියා අපේක්ෂකයෙකු ගේ ලියා පදිංචිය වලංගුවන කාල සීමාව කවරේද;

(ii) ඉහත ලියාපදිංචිය අවලංගු වූ රැකියා අපේක්ෂකයෙකු කොරියාවේ රැකියාවක් ලබා ගැනීම සඳහා නැවත අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කවරේද;

(iii) ඉදිරියේදී මේ සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේදී දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියා පදිංචිවී සිටින රැකියා අපේක්ෂකයින්හට ප්‍රමුඛත්වය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/'10

7.

ගරු එම්.ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2006 වර්ෂයේ පැවැත්වූ බවත්;

(ii) එම විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 16,000ක් අතරින්, 1000 ක පමණ පිරිසක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ බවත්:

(iii) එම පිරිසෙන් 550 දෙනෙකුට 2007 වර්ෂයේ අප්‍රියෙල් 01 වන දින සිට පත්වීම් ප්‍රදානය කළ බවත්;

(iv) එම පත්වීම්ලාභීන් අතර මෙම විභාගයට අදාළව 2006 වර්ෂයේ නිකුත් කළ ගැසට් නිවේදනයේ සඳහන් දිනට උපාධි සහතිකය නොමැති අය සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බදු නිලධාරීන් ලෙස ඉහත පත්වීම් ලැබූ එක් එක් අපේක්ෂකයාගේ නම, ලිපිනය සහ ලබා ගත් ලකුණු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2006.12.08 දින පෙරවරු 9.30ට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි ජා-ඇල නැගෙනහිර, තුඩැල්ල, අංක 76/සී, හි පදිංචි, ඩබ්ලිව්. ඒ. එස්. එම්. සෝවිස් මහත්මිය එම විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0380/'10

8\.

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රේෂ්ඨාධිකරණයෙහි, අභියාචනාධිකරණයෙහි, මහාධිකරණයෙහි සහ මහේස්ත්‍රාත් අධිකරණවල සේවය කරන සියලු විනිශ්චයකාරවරුන්ගේ නම් සහ උපන් දිනයන් කවරේද;

(ii) ඔවුන්ගේ සුදුසුකම් සහ දැනට දරන තනතුරෙහි පළපුරුද්ද කවරේද;

(iii) නිල නිවාස සපයා ඇති සියලු කාණ්ඩවල විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) සියලු විනිශ්චයකාරවරුන්ට නිල නිවාස නොසැපයීමට හේතු කවරේද;

(v) නිල නිවාස නොලැබෙන්නේ නම්, ඔවුන්ට නිවාස දීමනාවක් ගෙවනු ලබන්නේද;

(vi) එසේ නම්, ගෙවනු ලබන මුදල සහ එය කොපමණ කාලයක් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0507/'10

9\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වත්මන් විරැකියා ප්‍රතිශතය කොපමණද;

(ii) විරැකියාවෙන් පෙළෙන ප්‍රතිශතය අවම කිරීමට රජය ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද;

(iii) එම ක්‍රියාවලිය වෙනුවෙන් රජය වැය කළ මුදල කොපමණද;

(iv) රජය විසින් ක්‍රියාත්මක කළ ඉහත ක්‍රියා මාර්ගයන් විරැකියාව අඩුකිරීම සඳහා ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0714/'10

10\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වරාය අධිකාරියේ වත්මන් සභාපතිවරයාගේ සම්පූර්ණ නම සහ වයස කවරේද;

(ii) එම තනතුරට ඔහු පත් කළ බලධාරියා කවරෙක්ද;

(iii) එම සභාපතිවරයා මෙයට පෙර සේවය කළ ස්ථානය සහ තනතුර කවරේද;

(iv) ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් සහ වෘත්තීය පළපුරුද්ද කවරේද;

(v) ඔහුගේ මාසික වැටුප සහ ලැබෙන වෙනත් දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0527/'10

11\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල අධ්‍යාපන කලාපයට අයත් තංගල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය මගින් පාලනය වන හ/විගමුව විද්‍යාලයේ ගුරුමණ්ඩලය හා දරුදැරියන් මුහුණපා ඇති ගැටලු පිළිබඳව එම කලාප අධ්‍යාපන කාර්යාලය මගින් අදාළ අංශ දැනුවත් කර ඇත්දැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම විද්‍යාලයේ සිසුන් 110කට ආසන්න පිරිසක් අධ්‍යාපනය ලබන බවත්;

(ii) සියලු විෂයයන් ආවරණයට ගුරුවරුන් පස් දෙනෙකු පමණක් සිටින බවත්;

(iii) සියලු පන්ති පැවැත්වීම සඳහා වර්ග අඩි 50x20 සහ වර්ග අඩි 40x20 පාසල් ගොඩනැගිලි දෙකක් පමණක්ද, ගුරුවරුන්ට හා සිසුන්ගේ පරිහරණයට අබලන් තත්වයේ එක් වැසිකිළියක් පමණක්ද ඇති බවත්;

(iv) විදුලිබිල නොගෙවීම නිසා පාසලේ විදුලිය විසන්ධි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම විද්‍යාලයේ යටිතල පහසුකම් ප්‍රමාණවත් තත්ත්වයක පවතින්නේද;

(ii) නොඑසේ නම්, එම විද්‍යාලයට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දී විදුහලේ සහ සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0586/'10

12\.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිදහස ලබාගත් දා සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා රජය වෙනත් රටවලට ඉඩම් තෑගි ලෙස ලබාදී තිබේද;

(ii) එසේ නම්, ලබා දෙන ලද ඉඩම්වල ප්‍රමාණය පර්චස් හෝ අක්කර කොපමණද;

(iii) එසේ ඉඩම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) එසේ මෙරට ඉඩම් ලබා දුන් රටවලින් ඒ අයුරින්ම තෑගි ලෙස ඉඩම් ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

(v) එසේ නම්, එම ඉඩම් ලබා දුන් රටවල නම්, ඒවා ලබා දුන් දිනයන් සහ එසේ ලැබුණු ඉඩම් වල ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (හයවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2010 නොවැම්බර් 22) [1].

*2.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සහා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*3.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන, ජනාවාස හා රණවිරු සුභසාධන අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සහා (ලියාපදිංචි කිරීමේ)" නියෝගයෙහි 2(2) වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2010 අප්‍රේල් මස 12 වැනි දින අංක 1649/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

*5.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ නියෝග,— 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 20 අ වැනි වගන්තියේ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූලව එකී පනතේ 20 අ වැනි වගන්තිය සමග කියවිය යුතු 31 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 1667/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.11.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*10.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*12.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*13.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*14.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*15.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*16.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*17.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*18.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

19.

තාරුණ්‍යයට හෙටක් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත—දෙවැනි වර කියවීම

20.

රතු පියුම (ජාත්‍යන්තර) ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1] "පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.